# නාට්‍ය හා රංගකලාව

## 07 ශ්‍රේණිය - දෙවන වාරය

## තෙවන පාඩම

## මිනිස් හා සත්ත්ව චර්යා

- මිනිසුන් වන අපට ආවේනික හැසිරීම් රටාවන් පවතී. එමෙන් ම සතුන් ද එම සතාට අනුව චර්යා රටාවේ විවිධත්වයක් දැකිය හැකි ය. නමුත් අප හදිසි අවස්ථාවකට මුහුණ දුන් විට පෙර පැවති චර්යාව වෙනස් වේ. යම් තත්ත්වයකට මුහුණපෑ විට මිනිසුන් මෙන් ම සතුන් තුළ ද චර්යා වෙනස්වීම් දැකිය හැකි ය.

  - වයස හා අවස්ථාව අනුව චර්යා විධි වෙනස් වේ. පහත දැක්වෙන අවස්ථා ඔබට අනුකරණය කළ හැකි ය
    - අවුරුදු 4 ක දරුවකු ක්‍රියා කරන ආකාරය.
    - අවුරුදු 12 ක දරුවකු ක්‍රියා කරන ආකාරය.
    - අවුරුදු 19 ක තරුණයකු /තරුණියක යයි සිතා හැසිරෙන ආකාරය.
    - වයස අවුරුද 50 ක අයෙක් කටයුතු කරන ආකාරය.
    - අවුරුදු 80 ක අයෙක් කටයුතු කරන ආකාරය.

  - එක් එක් සතුන් අනුව චර්යා විධි වෙනස් වේ. පහත දැක්වෙන අවස්ථා ඔබට අනුකරණය කළ හැකි ය.
    - වඳුරෙක්
    - කාක්කෙක්
    - ගෙම්බෙක්
    - සිංහයෙක්
    - සතුන් වත්තක් නිර්මාණය කරන්න.

ඉහත දැක් වූ හැඩතල, ඉරියව් හා චලන රංගනයේ දී චරිතයට හා වේදිකාවට ගැළපෙන පරිදි සකස් කරගත යුතු වේ.

දක්ෂ නළුවෙකු වීම සඳහා මිනිස් / සත්ත්ව ඉරියව් හා චලන උපයෝගී කර ගෙන රංග අභ්‍යාසයන්හි නිරත වීම අවශ්‍ය වේ. එමෙන් ම අවට ලෝකයේ මිනිස් හා සත්ත්ව චරිත ඉතා මැනවින් අධ්‍යයනය කළ යුතු වේ.

## අභ්‍යාස

- මිනිස් හා සත්ත්ව චරිත වෙන වෙනම දක්වා ඒ ඒ මිනිස් හා සත්ත්ව චරිත වල ලක්ෂණ ලියන්න
- මිනිස් හා සත්ත්ව චරිත ඇතුළත් කර නාට්‍යයක් නිර්මාණය කර රඟ දක්වන්න.